# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,471 - 2026 ජනවාරි මස 09 සිකුරාදා - 2026.01.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශය ආදිය ... ... | — | රජයේ නිවේදන ... ... ... ... ... | 18 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | මිල පාලන දැන්වීම් ... ... ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 16 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... | 16 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... ... ... | |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | නැවියන්ට දැන්වීම් ... ... ... ... ... | — |
| | — | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජනවාරි මස 30 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජනවාරි මස 16 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

15 - B 82743- (2026/01)
E - 01

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2026 අංක 03

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනි ටී. බාබු මහත්මිය 2025 දෙසැම්බර් මස 01 දින සිට ක්‍රියාත්මකවන පරිදි, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩ බැලීම සඳහා පත් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. ඩී. ජේ. ප්‍රනාන්දු,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2025 දෙසැම්බර් මස 31 දින.

01 - 112/1

2026 අංක 04

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි එස්. එස්. මුදලිගේ මහතා 2025 දෙසැම්බර් මස 08 දින සිට ක්‍රියාත්මකවන පරිදි, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් තනතුරට පත් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. ඩී. ජේ. ප්‍රනාන්දු,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2025 දෙසැම්බර් මස 31 දින.

01 - 112/2

## වෙනත් පත්කිරීම් ආදිය

2026 අංක 05

**අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**

බන්ධනාගාර ආඥාපනත යටතේ පත්වීම

**ප්‍රාදේශීය වීක්ෂණ කමිටු**

බන්ධනාගාර ආඥාපනතේ 35(1) වගන්තියෙන් මා වෙත පැවරුන බලතල ප්‍රකාර අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය නීතිඥ හර්ෂණ නානායක්කාර වන මම 2025 දෙසැම්බර් මස 30 සිට ක්‍රියාත්මකවන පරිදි අවුරුදු තුනක කාලයක් සඳහා පහත නම් සඳහන් පුද්ගලයින් ප්‍රාදේශීය වීක්ෂණ කමිටු සාමාජිකයින් ලෙස පත් කරමි.

*උපලේඛනය*

| | *නම* | *ලිපිනය* |
|---|---|---|
| **නව මැගසින් බන්ධනාගාරය සඳහා වීක්ෂණ කමිටු සාමාජිකයන්** | | |
| 1. | ෂිරන් රුමේෂ් සෙත් මහතා | අංක 136, ටී 20 වත්ත, බේස්ලයින් මාවත, බොරැල්ල, කොළඹ 08. |
| 2. | රත්නයිදේගේ නිමල්කා මනෝහාරි රාජපක්ෂ මහත්මිය | අංක 184/2 බී, සීවලී පටුමහ, බොරැල්ල, කොළඹ 08. |
| 3. | අහමඩ් මීරා මොහොමඩ් ජවුෆර් මහතා | අංක 400/5සී, බුලර්ස් පාර, කොළඹ 07. |
| **කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය සඳහා වීක්ෂණ කමිටු සාමාජිකයන්** | | |
| 1. | නන්දන ජයවර්ධන මහතා | අංක 213/62, වුඩ්ලන්ඩ් පාක්, බාලිකා නිවාස පාර, රුක්මලේ, පන්නිපිටිය. |
| 2. | නිසංකා දේශානි හේවාවිතාරණ මහත්මිය | අංක 21, හල්ගස්වත්ත පටුමහ, කිරුළපන, කොළඹ 06. |

| | *නම* | *ලිපිනය* |
|---|---|---|
| 3. | මුණසිංහගේ බන්දුල සෙනෙවිරත්න මහතා | අංක 85/5, පීටර්සන් පටුමඟ, වැල්ලවත්ත, කොළඹ 06. |
| 4. | වන්නකුවත්ත වඩුගේ උත්පල තරංග ප්‍රනාන්දු මහතා | අංක 109/3, පයිප්ප පාර, කොළඹ 05. |

**වැලිකඩ බන්ධනාගාරය සඳහා වීක්ෂණ කමිටු සාමාජිකයන්**

| | | |
|---|---|---|
| 1. | ආර්. එම්. පෙරමුණේ මහතා | අංක 1575/134, නිව් සිටි, හොරහේන පාර, පන්නිපිටිය |
| 2. | මුහම්මදු මන්සූම් මුහම්මදු නස්වි මහතා | අංක 52/1, ආනන්දාරාම පාර, සාලමුල්ල, කොළොන්නාව. |
| 3. | වීරවත්තේ ගෙදර බවන්ති තත්සරණි මහත්මිය | අංක 83/6, බලපොකුණ පාර, කිරුළපන, කොළඹ 06. |
| 4. | ගෝපාලන් අරුලප්පන් මහතා | අංක 101/10, ජම්පටා වීදිය, කොළඹ 13. |

**බදුල්ල බන්ධනාගාරය සඳහා වීක්ෂණ කමිටු සාමාජිකයන්**

| | | |
|---|---|---|
| 1. | ඒ. එම්. සුනන්ද වසන්ත අත්තනායක මහතා | අංක 16/B, හංවැල්ල, බදුල්ල. |
| 2. | සන්ධ්‍යා කුමාරි ලියනගේ මහත්මිය | අංක 12/3, අලුත්වෙලගම, බදුල්ල. |
| 3. | එස්. පී. නයනජිත් බදුල්ල මහතා | වේවැස්සගම, විනීතගම, බදුල්ල. |
| 4. | ආර්. එම්. ජයසේන මහතා | අංක 141, ග්‍රීන්ලේන් ඩ්‍රයිව්, කයිලගොඩ, බදුල්ල. |

නීතිඥ හර්ෂණ නානායක්කාර, (නීතිඥ, පා.ම.)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 16 දින.
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,
අංක 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

01 - 101

---

2026 අංක 06

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

ගරු විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක ඇමතිතුමන් විසින් 2025 නොවැම්බර් මස 07 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නියුතු අයර්ලන්ත ජනරජයේ නිර්වේතතික කොන්සල්වරිය ලෙස ලුයිස් නිර්මලී පෙරෙයිරා මහත්මිය සතුටින් පිළිගෙන ඇත.

අරුණි රණරාජ,
ලේකම්,
විදේශ කටයුතු, විදේශ රැකියා සහ
සංචාරක අමාත්‍යාංශය.

2025 දෙසැම්බර් මස 11 දින.
කොළඹ 01,
ජනරජ ගොඩනැගිල්ලේ,
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ දී ය.

01-135

# රජයේ නිවේදන

**ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව**

1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත

**අංක 25/26 වගන්තිය යටතේ දැනුම් දීම**

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපතන 1959 අංක 5 දරන ආඥාපනත 1964 අංක 24 දරන පනත 1973 අංක 41 දරන පනත 1978 අංක 19 දරන පනත ආදී සංශෝධිත පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1) 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුභාෂිණී දයානන්ද මිය,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2025 දෙසැම්බර් මස 18 දින.
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව,
අංක 35ඒ,
ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත,
කොළඹ 08,

**උපලේඛනය**

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (01) 46782 | මුතුමදිනගේ සරත්චන්ද්‍ර ප්‍රනාන්දු මයා,<br>144/11A, නෙළුම් මාවත, ගොරකාන,<br>කෙසෙල්වත්ත. | ගම්මැද්ද ලියනගේ අජිත් සුමින්ද කුමාර මයා,<br>අංක 144/15 A, ගල්කණුව පාර, ගොරකාන,<br>කෙසෙල්වත්ත. |
| (02) 44858 | රංගල්ලගේ සිරියාවතී *හෙවත්* රංගල්ලගේ සිරිමාවතී නවරත්න මිය,<br>472, E1, 91/2, වත්ත, සමනල පෙදෙස,<br>මලව. | රණවීර ආරච්චි තෙනන්නැහැලාගේ නිහාල් එඩ්මන් රණවීර මයා,<br>නාරද විදුහල අසල, පත්බේරිය, පරකඩුව. |
| (03) 46824 | රාජපක්ෂ පතිරන්ගේ වංශජා ධිවානි රාජපක්ෂ මිය,<br>02, හේරත් මුදියන්සේලාගේ චමිලා ශ්‍රීපාලී,<br>77/17, විශාඛා පෙදෙස, අලපිටිවල, රාගම. | දොම්පේ ආචාරිගේ වරුණි සඳමාලි,<br>අංක 46/3, මැද්දෙගොඩ, ගණේමුල්ල. |
| (04) 46842 | එගොඩයලාගේ නිමල් රත්නසිරි පියසේන,<br>අංක 113, පලාවෙල උඩ, කිරිඇල්ල,<br>රත්නපුර. | නිස්සංක රාලලාගේ නාරද සම්පත් චන්ද්‍රසේන,<br>දිගන, තැපැල් කාර්යාලය,<br>රත්නපුර. |

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (05)<br>46841 | එගොඩයලාගේ නිමල් රත්නසිරි පියසේන,<br>අංක 113, පලාවෙල, උඩ කිරිඇල්ල,<br>රත්නපුර. | කාලංශ පේදුරු හේවගේ කමලාවතී මිය,<br>අංක 23, දීගනකන්ද, රත්නපුර. |
| (06)<br>44934 | ජලග්ගවත්තේ ගමරාලලාගේ සුනේත්‍රා ධම්මිකා මිය,<br>අංක 22/21, II පටුමග, එගොඩවත්ත,<br>බොරලැස්ගමුව. | අමදෝරුගේ සුජීව ශ්‍රී ලක්මාල් කුමාර මයා,<br>අංක 83, වීර මාවත, බෝකුන්දර, පිළියන්දල. |
| (07)<br>46845 | ගම්පලගේ විනීතා ෆොන්සේකා *නොහොත්* සීතා ෆොන්සේකා මිය,<br>අංක 64/1, කහපල, මඩපාත,<br>අංක 32, පරාක්‍රම නිවාස, මූණගම තිහාරන. | හේරත් මුදියන්සේලාගේ ප්‍රේමලාල් රංජිත් මයා,<br>අංක 131/D, පිංකැල්ල පාර, හිරණ. |
| (08)<br>46826 | 01. යොම් මෙරඤ්ඤ සීමන් හේවාගේ ප්‍රියන්ති සිල්වා මයා,<br>02. මනිත්ත හේවාගේ අංජන සදීපන ධරමපාල,<br>03. මනිත්ත හේවාගේ අවේෂ් නිම්සර ධරමපාල,<br>04. මනිත්ත හේවාගේ නිසනි නයනමා,<br>අංක 358/A 1, ශ්‍රී සංඝානන්ද මාවත,<br>වාද්දුව. | සුසෙව් හේවාගේ ධම්මිකා සුදර්ශනී විජයගල මිය,<br>අංක 329 B, ශ්‍රී සංඝානන්ද මාවත, හෙතුපිටිය, වාද්දුව. |
| (09)<br>43654 | මිනිත්තන්ත්‍රිගේ ඉරෝෂා දීපානි පෙරේරා මිය,<br>අංක 568/D, ද සොයිසා මාවත, නාගොඩ, කළුතර. | හේවා ෆොන්සේකාගේ තනුජා ශෂිකලා ෆොන්සේකා මිය,<br>අංක 50/5, මහා විහාර පාර, වාද්දුව,<br>පැවරුම්ලාභී<br>01. නාකන්දලාගේ දොන් මාලක විශ්ව ගීතාල් මයා,<br>අංක 19, හිඹුටුවිල ලන්ද, විල්පාත පාර,<br>දොඩන්ගොඩ. |
| (10)<br>46833 | උදුගොඩගේ ඉෂාරා මධුෂානි රුද්‍රිගෝ,<br>අංක 409/A/2, මහගෙදර වත්ත, බටහිර පරගස්තොට,<br>පරගස්තොට. | තුඩුවගේ ඉන්ද්‍රා චාන්දනී මිය,<br>ගුණගොඩ, පරදූව, ගල්පාත. |
| (11)<br>KU 205 | කපුරාලගේ රත්නපාල ජයනෙත්ති මයා,<br>බණ්ඩාරවත්ත, මිල්ලව, මල්ලවපිටිය, කුරුණෑගල. | විජේසිංහගේ ප්‍රසන්න විජේසිංහ මයා,<br>අංක 15, රණවිරු ගම්මානය, මරදන්කඩවල. |
| (12)<br>KU282 | දම්මන ආරච්චිගේ චන්දන අමරසේකර,<br>මී ගහපැලැස්ස, වැලිපැන්න, ගහමුල්ල. | දොලේ වත්තගේ රචෝදාා සත්සරණි චන්ද්‍රසිරි මිය,<br>මාදෙල් ගමුව, වඩුමුත්තේගෙදර. |
| (13)<br>45404 | මෙරගල්පේඩිගේ ගාමිණී මයා,<br>වත්තේගම, බිංගිරිය. | කරුණා පේඩිගේ චිත්‍ර සෝම මයා,<br>රත්මල්වල, වැල්ලරාව. |
| (14)<br>45403 | මෙරගල්පේඩිගේ ගාමිණී මයා,<br>වත්තේගම, බිංගිරිය. | කරුණා පේඩිගේ චිත්‍ර සෝම මයා,<br>රත්මල්වල, වැල්ලරාව. |
| (15)<br>KU 65 | මෙරගල්පේඩිගේ ගාමිණී මයා,<br>වත්තේගම, බිංගිරිය. | කරුණා පේඩිගේ චිත්‍ර සෝම මයා,<br>රත්මල්වල, වැල්ලරාව |

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (16)<br>GAM 561 | රනේපුර හේවගේ රහුල් හරිත වෛද්‍යාසේකර මයා,<br>අංක 27/B/01, යමුනා විජේසිංහ මාවත,<br>මාකෙවිට. | බුලත්සිංහලගේ දොන් ඥානතිලක උපුල් ශාන්ත කුමාර මයා,<br>අංක 02, කුරුසාමි රාණි මිය,<br>අංක 27/B, යමුනා විජේසිංහ මාවත, මාකෙවිට. |
| (17)<br>GAM 550 | හේවගේ සුමුදු සුභාෂිනි මිය,<br>අංක 1178/6,<br>දළුපිටිය පාර, හුණුපිටිය, වත්තල. | තෙලිකඩ පල්ලිය ගුරුන්නාන්සේලාගේ ඕලුක්ස් අශ්මික අල්විස්<br>ඇටෝනි බලකරු,<br>තෙලිකඩ පල්ලිය ගුරුන්නාන්සේලාගේ ඩෙන්සිල් අල්විස්,<br>අංක 595/2A, මංකඩ පාර, ඉහල බියන්විල, කඩවත. |

01 - 126

---

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

වන්දනා ගමන් ආඥාපනත

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා විසින් (175 අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනතේ 2 වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම),
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 29 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිල මැදුර,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

**නියෝග**

1. මේ නියෝග “මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නායිම්බල 02 ග්‍රාම නිලධාරී වසමේ, මීදෙල්ලවල පුරාණ රජ මහා විහාරස්ථානයේ ශ්‍රී සර්වඥ ධාතු මහා පෙරහැර මංගල්‍යය නියෝග” යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග වල -
“කඳවුරු පෙදෙස” යන්නෙන් මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලැබ ඇති ප්‍රදේශ අදහස් වේ.

“දිස්ත්‍රික් ලේකම්/දිසාපති” යන්නෙන් මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් /දිසාපතිවරයා අදහස් වන අතර, ඔහු විසින් 4 වැනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධාරියෙක් ද ඊට ඇතුළත් වේ.

“වෛද්‍ය නිලධරයා” යන්නෙන් කඳවුරු පෙදෙස භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ.

“වන්දනාකරු” යන්නෙන් කඳවුරු පෙදෙසට ඇතුළත් වී කවර හෝ කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස තුළ නතර වී සිටින යම් තැනැත්තෙක් අදහස් වේ.

"පොලිස් නිලධරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර යම් ග්‍රාම නිලධරයෙක් ද අදහස් වේ.

"මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා අදහස් වේ.

3. මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නායිම්බල 02 ග්‍රාම නිලධාරි වසමේ, මීදෙල්ලවල පුරාණ රජ මහා විහාරස්ථානයේ ශ්‍රී සර්වඥ ධාතු මහා පෙරහැර මංගල්‍යය නියෝග" සඳහා කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් අදාළ වන්නේය.

4. මේ නියෝග යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත පැවරී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නියම වී ඇති යම් කාර්යයක් ඉටු කිරීම සඳහා යම් රජයේ නිලධාරියකු වෙත ලිඛිතව බලය පැවරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේය.

5. (1) කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසින් පිටතට හෝ කඳවුරු පෙදෙස ඇතුළත හෝ වාහන ගමනාගමනය හෝ පයින් ගමන් කිරීම විධිමත් කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

(2) මේ නියෝගය (1) වැනි ඡේදයේ තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් පොලිස් නිලධරයෙකුට දෙන ලද උපදෙස්වලට අනුකූලව එම පොලිස් නිලධරයා විසින් කරනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙකු විසින් ක්‍රියා නොකරනු ලැබිය යුතු ය.

6. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කිසිම ගවයකු හෝ වෙනත් යම් සතෙකු හෝ කඳවුර පෙදෙස තුළට ගෙන ඒම නොකළ යුතු ය.

එසේ වුව ද, 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවතා තැබීම සඳහා වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා, කරත්ත ගෙන යාම හෝ ගොනුන් දක්කාගෙන යාම හෝ සම්බන්ධයෙන් අවසර ලබා ගැනීම අවශ්‍ය නොවන්නේ ය.

7. (1) කඳවුරු පෙදෙස ඇතුළත පහත සඳහන් ස්ථාන වෙන් කර තැබීමට හෝ සැපයීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය :

(අ) බස්රථ හා වෙනත් මෝටර් වාහන නවතා තබන ස්ථාන ;
(ආ) කරත්ත නවත්වා තැබීමේ හා ගොනුන් බැඳ තැබීමේ ස්ථාන ;
(ඇ) එක් එක් වන්දනා නඩයට නවාතැන් ගැනීම පිණිස වෙන වෙනම ස්ථාන ;
(ඈ) අසනීප වන වන්දනාකරුවන් සඳහා සුරැකුම් ස්ථාන ;
(ඉ) සිඟමන් යැදීමට සහ පිනට ඉල්ලා ගැනීම් කිරීම සඳහා ස්ථාන ;
(ඊ) විකිණීම සඳහා යම් ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරනු ලබන ස්ථාන ;
(උ) වෙනත් පුහුණු කටයුතු සඳහා තාවකාලික මඩු ඉදි කිරීමට හැකි ස්ථාන ;
(ඌ) සේදීමේ සහ ස්නානය කිරීමේ කාර්යය සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ ස්ථාන ;
(එ) බීමට ජලය ලබා ගැනීම සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා, සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන ;
(ඒ) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකන වෙනත් කාර්යයන් සඳහා වූ ස්ථාන.

(2) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකනු ලැබුවහොත් ඔහු විසින් (1) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් පරිදි යම් ප්‍රදේශයක් වෙන් කරනු ලැබ ඇත්තේ කවර කාර්යයක් සඳහාදැයි දැක්වෙන දැන්වීමක් හෝ නාම පුවරුවක් එකී එක් එක් ස්ථානයෙහි තැබීමට කටයුතු සැලැස්විය හැකිය.

(3) (1) වැනි ඡේදය යටතේ වූ යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් වෙන් කරනු ලැබූ හෝ සපයනු ලැබ ඇති අවස්ථාවක දී ඒ ස්ථානය හුදෙක් එම කාර්යය සඳහා පමණක්ම පාවිච්චි කරනු ලැබිය යුතු අතර, කඳවුරු පෙදෙස ඇතුළත වෙනත් කිසිම ස්ථානයක් එම කාර්යය සඳහා කිසිම තැනැත්තෙකු විසින් පාවිච්චි නොකරනු ලැබිය යුතුය.

8. රෝග වළක්වාලීම සඳහා කඳවුරු පෙදෙස තුළ යම් වැවකට, ළිඳකට, දිය වලකට හෝ ජලාශයකට ක්ලෝරීන් යෙදීම හෝ යම් වැවක්, ළිඳක්, දිය වලක් හෝ ජලාශයක් වසා දැමීම හෝ අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට හෝ වෛද්‍ය නිලධරයාට හෝ බලය ඇත්තේ ය.

9. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය මත සහ එවැනි අවසර පත්‍රයක සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට අනුකූලව මිස, යම් තැනැත්තෙකු විසින් 7 නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස් තුළ වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ තැනීමක් හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් කොටසක් එකතු කිරීම හෝ නොකරනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තෙකු විසින් මේ නියෝගයේ (1) ඡේදයට පටහැනිවන පරිදි යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් සාදනු ලැබීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදිකිරීමකට අලුතින් කොටසක් තැනීම හෝ එකතු කිරීම හෝ කරනු ලැබුවහොත් ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු එම දැන්වීමේ සඳහන් කරනු ලබන කාල සීමාව ඇතුළත අවස්ථාවෝචිත පරිදි එම මඩුව හෝ ඉදිකිරීම හෝ දැනට පවත්නා ගොඩනැගිල්ලකට අලුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කරන ලෙස හෝ කඩා දමන ලෙස දිස්ත්‍රික් ලේකම් /දිසාපතිවරයා විසින් එම තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) මෙම නියෝගයේ (2) ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් එහි සඳහන් කාල සීමාව තුළ ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ එම දැන්වීම භාර දෙනු ලැබිය යුතු නියම තැනැත්තා කවරෙක් ද යන්න පිළිබඳව සැකයක් උද්ගත වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ මඩුව හෝ ඉදිකිරීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කිරීමට හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන කම්කරුවන්, උපකරණ සහ යන්ත්‍රෝපකරණ සහිතව දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළු වනු ලැබීම ද , එම ඉවත් කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන සියලු දේ කිරීම හෝ එසේ කිරීමට දිස්ත්‍රික් ලේකම්වරයා/දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

10. වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද බවට දැන්වීමක් හෝ සංඥා පුවරුවක් මගින් පෙන්වා ඇති යම් වැසිකිලියක හැර කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ මළමුත්‍රා පහ කිරීම නොකරනු ලැබිය යුතු ය.

11. කඳවුරු පෙදෙස තුළ යම් වැවක, ළිඳක, දිය වලක, ජලාශයක, ඇළක, දොළක හෝ දිය පාරක ඇති ජලය කිසිම තැනැත්තෙකු විසින් අපිරිසිදු නොකරනු ලැබිය යුතු ය.

12. කැළිකසළ දැමීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරයා/දිසාපතිවරයා විසින් සපයනු ලැබ ඇති ස්ථානයකට හෝ භාජනයකට මිස කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ද්‍රව්‍යමය හෝ ද්‍රවමය කැළිසකළ දැමීම නොකරනු ලැබිය යුතු ය.

13. (1) කඳවුරු පෙදෙස තුළ වන්දනාකරුවන්ට පිසූ ආහාර පාන බෙදාහැරීම විධිමත් කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) තමා වෙත මේ නියෝගයේ (1) ඡේදය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් දෙනු ලබන උපදෙස්වලට අනුකූලව යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් හෝ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට කිසිම තැනැත්තෙකු අකීකරු නොවිය යුතු ය.

14. (1) කඳවුරු පෙදෙස තුළ විකිණීම සඳහා, වන්දනාකරුවන්ට බෙදා දීම සඳහා ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති යම් ආහාරයක් හෝ පානයක් අපවිත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු වී ඇති බව පෙනී ගිය අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් හෝ වෛද්‍ය නිලධාරියා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ ආහාරය හෝ පානය මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) මේ නියෝගයේ (1) ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද ආහාරයක් හෝ පානයක් කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ විකිණීම හෝ බෙදා හැරීම හෝ නොකරනු ලැබිය යුතු ය.

(3) මෙම නියෝගයේ (1) ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද යම් ආහාරයක් හෝ පානයක් විකිණීම හෝ බෙදා හැරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් තහනමට ගෙන විනාශ කර දමනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

15. බේකරියක්, රස කැවිලි හලක්, හෝ රස කැවිලි නිෂ්පාදනාගාරයක්, භෝජනාගාරයක් හෝ දන්සලක් පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය මත සහ ඒ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව

මිස කිසිම තැනැත්තෙකු විසින් 7 නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක හෝ කඳවුරු පෙදෙස තුළ අන් ස්ථානයක හෝ එවැනි බේකරියක්, රස කැවිලි හලක් හෝ රස කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම නොකරනු ලැබිය යුතු ය. සෑම බලපත්‍රයක්ම වෛද්‍ය නිලධරයාගේ හෝ වෛද්‍ය නිලධරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තෙකුගේ හෝ නිර්දේශය මත ගාස්තුවකින් තොරව නිකුත් කරනු ලැබිය යුතු ය.

16. කඳවුරු පෙදෙස තුළ ඇති සියලුම බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර සහ දන්සැල් සහ ඒවායේ ඇති සියලු ගෘහ භාණ්ඩ සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂාවට හිතකර තත්ත්වයකින් තබා ගත යුතු ය.

17. කඳවුරු පෙදෙස ඇතුළත විකිණීම සඳහා හෝ බෙදා හැරීම සඳහා හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති සියලුම කේක් වර්ග, රස කැවිලි සහ පිසින ලද ආහාර වෛද්‍ය නිලධරයා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ සෑහීමකට පත්වන පරිදි මැස්සන්ට ඇතුල්විය නොහැකි පරිදි නිසි ලෙස තනන ලද වීදුරු ආවරණ තුළ තැබීම කරනු ලැබිය යුතු ය.

18. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය හෝ යම් ආහාරයක හෝ පානයක ඉතිරි වූ කොටස් හෝ පිසීමේ දී හෝ අන් අයුරකින් ඉවතලන ද්‍රව්‍ය හෝ කඳවුරු පෙදෙසේ කිසිම ස්ථානයක අනාවරණව නොතිබිය යුතු ය. එවැනි සියලු අපද්‍රව්‍ය ඉතිරි වූ කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය 19 නියෝගයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතු ය. එවැනි සියලු අපද්‍රව්‍ය, කසළ හෝ ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස ඇතුළත යම් ස්ථානයක හෝ ඒ අසළ පොළවේ විසිකොට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයෙහි අයිතිකරු විසින් හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ ඒ ස්ථානය බේකරියක්, රස කැවිලිහලක්, රස කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් වන අවස්ථාවක ඒ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් හෝ එම වරද සිදුවීම වැළැක්වීමට අවශ්‍ය සියලුම පූර්වෝපාය යෙදූ බව සහ නිසි සැලකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස එකී අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලපත්‍රලාභියා මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලැබේ.

19. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියලු බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර, දන්සැල් සහ වෙළඳ හෝ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝන මීටර 1 ½ කට (ඝන අඩි 4 ½ට) නොඅඩු ධාරිතාවක් ඇති දැවමය, ලෝහමය හෝ ප්ලාස්ටික් කසළ බඳුනක් සපයනු ලැබිය යුතු අතර, එකී කසළ බඳුන එහි කසළ තැන්පත් කරනු ලබන විට හෝ ඉන් කසළ ඉවත් කරනු ලබන විට හැර වෙනත් සෑම අවස්ථාවකදීම දැවමය, ලෝහමය, ප්ලාස්ටික්, පියනකින් වසා තැබිය යුතු ය.

20. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ මතය අනුව මෙම නියෝගවල 16, 17, 18 හෝ 19 නියෝග කඩකරමින් පිහිටුවනු ලැබ ඇත්තා වූ හෝ පවත්වාගෙන යනු ලබන්නා වූ ද, යම් බේකරියක්, කැවිලිහලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක්, දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම්, එකී බලපත්‍රය වහාම අවලංගු කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) යම් බේකරියක් හෝ කැවිලිහලක් හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් බාරව සිටින යම් තැනැත්තෙකු විසින් මේ වගන්තියේ (1) ඡේදය යටතේ දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාගේ යම් නිත්‍යානුකූල විධානයකට අනුකූලව ක්‍රියා කළ යුතුය.

21. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළු නොවිය යුතු ය.

22. (1) කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් පැතිරී යන විටක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් වන්දනාකරුවන්ට කඳවුරු පෙදෙසින් වහාම පිටවන ලෙස නියම කරනු ලැබීම ද, ඉවත්ව යා යුතු ගමන් මාර්ගය සහ ඉවත්ව යාමේ දී උපයෝගී කරගත යුතු ප්‍රවාහන ක්‍රමය හා පිළිවෙල දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නියම කරනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

(2) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් මෙම වගන්තියේ (1) ඡේදය යටතේ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙක් ක්‍රියා නොකළ යුතු ය.

23. කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති සෑම තැනැත්තෙක්ම ද, එසේ යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති බව දැන දැනම ඒ තැනැත්තා සමඟ එකට වාසය කරන සෑම තැනැත්තෙක්ම ද, ඒ බව වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධරයෙකුට හෝ වහාම වාර්තා කළ යුතු ය.

24. ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන හෝ පෙළෙන්නේ යැයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලිහලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් තත් කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයකට, භෝජනාගාරයට හෝ දන්සැලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් හෝ ආහාරපාන හෝ බෙදා හැරීමේ දී, විකිණීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී හෝ සහභාගීවීමට හෝ ඉඩ නොදෙනු ලැබිය යුතු ය.

25. යම් බේකරියක, කැවිලිහලක හෝ කැවිලි සාදන ස්ථානයක, භෝජනාගාරයක හෝ දන්සැලක බලපත්‍රධාරියෙකු විසින් හෝ යම් නවාතැන්පළක හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් හෝ පෙළෙන යම් තැනැත්තෙකුට අස්ථාවෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලිහලේ හෝ කැවිලි සාදන ස්ථානයේ, භෝජනාගාරයේ, දන්සැලේ, නවාතැන්පලේ හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවේ කවර හෝ කාලසීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතු ය. එවැනි ස්ථානයක ආසාදන රෝගියෙකු හෝ ස්පර්ශක රෝගියෙකු සිටින බව අනාවරණය වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එහි බලපත්‍රධාරි විසින් හෝ අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ එම කරුණ වහාම වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියෙකුට වාර්තා කළ යුතු ය.

26. 7 වැනි නියෝගය යටතේ හිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයක දී හැර කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතු ය.

27. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ගිනිකෙළි භාණ්ඩ හෝ ගිනි අවි කිසිවක් පත්තු කිරීම නොකළ යුතු ය.

28. 7 වැනි නියෝගය හෝ 10 නියෝගය යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය.

29. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා, වෛද්‍ය නිලධරයා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා, හෝ යම් පොලිස් නිලධරයෙකු විසින්,

(අ) මේ නියෝග අතුරෙන් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළු වීම ; සහ

(ආ) 7 වැනි නියෝගය යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක් ගොඩනැගීම නීත්‍යානුකූල වන්නේ ය.

30. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින්,

(අ) 6 නියෝගය හෝ 27 නියෝගය යටතේ දෙන ලද යම් අවසරයක්,
(ආ) 9 නියෝගය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක්, සහ
(ඇ) 15 නියෝගය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්
අවලංගු කිරීම යෝග්‍ය යැයි හෝ මහජන යහපත පිණිස වන්නේ යැයි දිස්ත්‍රික් ලේකම්වරයා/ දිසාපතිවරයාට පෙනී යන්නේ නම්, ඔහු විසින් කවර හෝ වේලාවක ඒ එසේ අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

**උපලේඛනය**

මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නායිම්බල 02 ග්‍රාම නිලධාරි වසමේ, මිදෙල්ලවල පුරාණ රජ මහා විහාරස්ථානයේ පිහිටි භූමි භාගයේ ඊට අයිති මායිම් පහත දැක්වේ.

| | |
|---|---|
| *උතුරට* | : හක්මණ කඹුරුපිටිය ප්‍රධාන මාර්ගය; |
| *දකුණට* | : වෙල්යාය; |
| *නැගෙනහිරට* | : වෙල්යාය; |
| *බස්නාහිරට* | : පංසල ලඟ කොරටුව ඉඩම; |

01-127

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.